සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ගෘහ ආර්ථික විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතු යි:
(i) පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) පහත සඳහන් සිද්ධිය අධ්‍යයනය කර දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කවීෂා 11 ශ්‍රේණියේ ඉගෙනුම ලබයි. ඇයට ගෘහ ආර්ථික විද්‍යාව විෂයට අදාළව මැහුම් වැඩ සඳහා රෙදි මිලට ගැනීමට අවශ්‍යව ඇත. සති අන්තයේ ඇය සමග නගරයට යාමට සූදානම්වන මව, පවුලට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීමට ද අදහස් කරන්නීය.

රැකියාවල නිරත වන මව හා පියා ගොඩනැගෙමින් පවතින තම නිවස පිළිබඳව නිරතුරුව සොයා බලති. මුල් ළමා වියෙහි පසුවන කවිෂාගේ නැගණිය මිත්තණියගේ රැකවරණය යටතේ දිවා කාලයේ නිවසේ සිටින්නීය.

(i) වෙළඳපොළින් මිලදී ගතහැකි සගන්ධවත් එළවළු වර්ග හතරක් නම් කරන්න.
(ii) රැකියාවට රැගෙන යන දිවා ආහාරයේ තිබිය යුතු ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
(iii) කවිෂා පසුවන අවධියේ විශේෂ පෝෂණ අවශ්‍යතා දෙකක් සඳහන් කර, එයට හේතුව බැගින් සඳහන් කරන්න.
(iv) මිත්තණියට කැල්සියම් ඌනතාව නිසා ඇතිවිය හැකි රෝගී තත්ත්වයක් නම් කරන්න.
(v) මැහුම් වැඩ සඳහා තෝරා ගන්නා රෙදිවල තිබිය යුතු ගුණාංග දෙකක් දක්වන්න.
(vi) උපාංග නිර්මාණයේ දී භාවිත කරන ද්‍රව්‍ය හා මෙවලම් දෙක බැගින් සඳහන් කරන්න.
(vii) කවිෂාගේ සමාජ සංවර්ධනය සඳහා පාසලින් ලබාදියහැකි අවස්ථා හතරක් සඳහන් කරන්න.
(viii) යොවුන්වියේ දරුවන් ප්‍රජනක සෞඛ්‍යය නොරැකීම නිසා ඇතිවිය හැකි ගැටළු දෙකක් ලියන්න.
(ix) කාර්ය බහුල උදෑසනක කවිෂාගේ පවුලට අනුගමනය කළ හැකි ක්‍රමවේද දෙකක් දක්වන්න.
(x) මිත්තණිය නිවසේ සිටීම නිසා පවුලට සැලසෙන වාසි දෙකක් දක්වන්න.

(10 x 2 = 20)

(02) (i) ළමා ඇඳුමක් නිර්මාණය කිරීම සඳහා රෙදි තෝරා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) ළමා ඇඳුමේ කඳ කොටසේ පතරොම නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය ප්‍රධාන මිනුම් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) ළමා ඇඳුමේ කඳ කොටස විසිතුරු කිරීම සඳහා සුදුසු මෝස්තරයක් ඇඳ, ඒ සඳහා යෙදෙන මිනුම් ක්‍රම හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(03) (i) ශරීරය තුළ විටමින් A මගින් ඉටුකරන කෘත්‍යයන් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) සංතෘප්ත මේද අම්ල හා අසංතෘප්ත මේද අම්ල තුන බැගින් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාව තුළ දැකිය හැකි ප්‍රධාන පෝෂණ ගැටලුවක් ලෙස "නීරක්තිය" දැක්විය හැකි ය. නීරක්තියේ රෝග ලක්ෂණ සඳහන් කරන්න (ලකුණු 04)

(04) (i) ආහාර පාරිරක්ෂණයේ දී, නරක්වීම වැළැක්වීම සඳහා උපක්‍රම යොදා ගැනීමේ අරමුණු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) ආහාර සඳහා ප්‍රමිතියෙන් තොර ආකලන භාවිතයෙන් ඇතිවිය හැකි හානි තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) වියළි තාපයෙන් පිසීමේ ක්‍රම හතරක් නම් කර, උදාහරණය බැගින් සඳහන් කරන්න. (ලකුණු 04)

(05) (i) ගෘහීය අයවැය ලේඛනයක් භාවිතයෙන් ඇති වාසි තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) ඔබේ නිවස හා ගෙවත්ත පිරිසිදු කොට අලංකාර කිරීමේ දී පවුලේ සාමාජිකයින්ගේ ශ්‍රම විභජනයෙන් එය කළහැකි ආකාරය කළමනාකරණ ක්‍රියාවලියට අනුව වගුගත කරන්න. (ලකුණු 03)

(iii) ඔබේ නිදන කාමරය "ඒක වර්ණ ගැලපුම" අනුව අලංකාර කරන ආකාරය උදාහරණ සමඟ පැහැදිලි කරන්න. (ලකුණු 04)

(06) (i) "ප්‍රතීක ක්‍රියා" යනු කුමක්දැයි කෙටියෙන් දක්වා උදාහරණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) ගර්භණී මවක් රැකබලා ගැනීමේ දී විශේෂයෙන් අවධානය යොමුකළ යුතු කරුණු තුනක් දක්වන්න. (ලකුණු 03)

(iii) මව්කිරි දීම නිසා දරුවාට හා මවට ඇතිවන ප්‍රයෝජන දෙක බැගින් දක්වන්න.(ලකුණු 04)

(07) (i) ස්ත්‍රී හා පුරුෂ ලිංගික හෝමෝන නම් කර, ඒවා ශ්‍රාවය උත්තේජනය කෙරෙන ග්‍රන්ථිය නම් කරන්න. (ලකුණු 03)

(ii) දරුවාට අතිරේක ආහාර හුරු කිරීමේ දී සැළකිය යුතු කරුණු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) ජැපනීස් එන්සෙෆලයිටිස් එන්නත හා MMR එන්නත පළමු මාත්‍රාව දෙනු ලබන වයස් සීමාව හා ඒවායින් වළක්වන රෝග වගු ගත කරන්න. (ලකුණු 04)